කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)- 2024

2026 - මැයි

# BCOME 3072 - විගණනය සහ සහතික වීම

ප්‍රශ්න සංඛ්‍යාව : (පහයි ) 05 කාලය : පැය 03 යි

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක **01**

ඔබ වරලත් ගණකාධිකාරීවරුන්ගේ සමාගමක් වන **Apex Audit Associates** හි විගණන කළමනාකරු වේ. ඔබේ සේවාදායකයා වන **Green Leaf Organics (Pvt) Ltd** කාබනික ආහාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛයෙකි. අද **2026** දෙසැම්බර් **10** වන දින වන අතර, **2026** දෙසැම්බර් **31** වන දිනෙන් අවසන් වන වසර සඳහා ඔවුන්ගේ විගණනය සිදු කිරීමට ඔබේ ආයතනයට ආරාධනා කර ඇත.

මෑතකදී සමාගමේ හිමිකාරීත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය සම්පූර්ණයෙන්ම වෙනස් වූ අතර අභ්‍යන්තර පාලන පද්ධති ද ප්‍රතිව්‍යුහගත කරන ලදී. **2027** පෙබරවාරි මුල වන විට විගණනය අවසන් කර වාර්තාව ලබා දෙන ලෙස කළමනාකාරීත්වය දැඩි ලෙස ඉල්ලා සිටියි. මෙම කාර්යබහුල කාලය නිසා ඔබේ සමාගම අඩු පළපුරුදු කණ්ඩායමක් යෙදවීමට සැලසුම් කරයි. තවද, ඔබේ විගණන හවුල්කරුගේ ඥාතියෙකුගේ බිරිඳ වන පෙරේරා මහත්මිය **Green Leaf Organics (Pvt) Ltd** හි ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය (CFO) ලෙස මෑතකදී පත් විය. වසර මුලදී ඔබගේ ආයතනය විසින් මෙම සමාගමට තක්සේරු උපදේශන සේවා (Valuation services) ද ලබා දී තිබුණි.

අ) මූල්‍ය ප්‍රකාශන විගණනයක වැදගත්කම සාකච්ඡා කරන්න. විගණකවරුන් නිරපේක්ෂ සහතිකයට (Absolute assurance) වඩා සාධාරණ සහතිකයක් (Reasonable assurance) ලබා දෙන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහය අනුව, මෙම විගණනය භාර ගැනීමට පෙර ඇගයිය යුතු සදාචාරාත්මක සහ වෘත්තීය ගැටලු මොනවාද?

(ලකුණු 10)

ඇ) දෙවන වසරටත් විගණනය සිදු කරන අවස්ථාවක, විගණන ගිවිසුමේ නියමයන් (Engagement terms) යාවත්කාලීන කිරීමට හෝ පවතින නියමයන් සිහිකැදවීමට තීරණය කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු හඳුනා ගන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක **02**

**Pure Pulse Beverages (Pvt) Ltd** නැමැති දේශීය පලතුරු යුෂ නිෂ්පාදන සමාගම සේවකයින් 120 කින් යුක්ත වේ. නමුත් සමාගම සතුව විධිමත් ව්‍යාපාරික ක්‍රියාවලීන් හෝ අභ්‍යන්තර පාලනයන් නොමැත. කළමනාකාර අධ්‍යක්ෂගේ භාර්යාව වන නිලන්ති මහත්මිය (විෂය පිළිබඳ දැනුමක් නොමැතිව) හිඟ මුදල් එකතු කිරීම සහ ඉන්වොයිස් කිරීම සිදු කරයි. පසුගිය වසර 3 පුරා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති අතර මිලදී ගැනීම් සඳහා නිසි ලේඛන පවත්වාගෙන යන්නේ ද නැත. කළමනාකාර අධ්‍යක්ෂවරයා ඍජුවම සැපයුම් මිලදී ගැනීමට සම්බන්ධ වේ. දැන් සමාගම පරිගණකගත පද්ධතියක් හඳුන්වා දීමට සූදානම් වේ.

**අ)** පහත පාලන ක්‍රම උදාහරණ සහිතව පැහැදිලි කරන්න: මෙහෙයුම් පාලන, මූල්‍ය පාලන සහ අනුකූලතා පාලන.

(ලකුණු 05)

**ආ)** මෙම සමාගමේ අභ්‍යන්තර පාලන දුර්වලතා 3 ක් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය පාලනයන් විශ්ලේෂණය කරන්න.

(ලකුණු 10)

**ඇ)** අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමේදී COSO රාමුවේ ඇති සංරචක (Components) වල වැදගත්කම විස්තර කරන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක **03**

ඔබ **Horizon Synergy Group** හි **2026** මාර්තු **31** දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන විගණනයේ ජ්‍යෙෂ්ඨ භාරකරු වේ. මෙම සමූහය ඉදිකිරීම්, මූල්‍ය සේවා සහ තාක්ෂණික විසඳුම් ඇතුළු විවිධ ක්ෂේත්‍රවල ක්‍රියාත්මක වේ. සමූහ මූල්‍ය අධ්‍යක්ෂවරියට එරෙහිව වත්කම් අවභාවිතය පිළිබඳව චෝදනා එල්ල වී ඇත.

**අ)** ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන අවදානම (ROMM) සහ සාක්ෂි රැස් කිරීමේ ප්‍රමාණය අතර ඇති සම්බන්ධය සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

**ආ)** විගණන සාක්ෂිවල ප්‍රමාණවත් බව සහ යෝග්‍යතාවය පැහැදිලි කර, සාක්ෂිවල විශ්වසනීයත්වයට බලපාන කරුණු 4 ක් දක්වන්න.

(ලකුණු 10)

**ඇ)** SLAuS 240 අනුව වංචා වැළැක්වීමේදී විගණකගේ වගකීම විස්තර කර ආදායම් හඳුනා ගැනීමට අදාල විගණන ක්‍රියා පටිපාටි 4 ක් දක්වන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක **04**

අ) ඔබ **Visionary Audit Corp** හි විගණන අධීක්ෂකවරයෙකි. ඔබේ සේවාදායකයා වන **BioShield Chemicals (Pvt) Ltd** හි **2026** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා වන විගණනය ඔබ සැලසුම් කරයි. සමාගම නව ජෛව නිෂ්පාදන පෙළක් සඳහා රු. මිලියන 4 ක් ආයෝජනය කර ඇත. මෑතකදී හඳුන්වා දුන් Cloud-base මෘදුකාංගයේ ක්‍රියාකාරීත්වය **2027** පෙබරවාරි දක්වා ප්‍රමාද වී ඇති අතර, ජ්‍යෙෂ්ඨ මූල්‍ය නිලධාරීන් දෙදෙනෙකු **2026** දෙසැම්බර් මස ඉල්ලා අස් වී ඇත.

1. මෙම අවස්ථාවේදී හඳුනාගත හැකි විගණන අවදානම් (Audit risks) 4 ක් සහ ඒවාට විගණකගේ ප්‍රතිචාර දක්වන්න.

(ලකුණු 10)

2. විගණක වාර්තාවක ප්‍රධාන විගණන කාරණයක් (KAM) ඇතුළත් කිරීමේ අරමුණ සහ වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

ආ) **Trend Setter Fashion** සේවක ඉවත් කිරීම් සඳහා රු. 110,000 ක ප්‍රතිපාදනයක් වෙන් කර ඇති බව 2026 මාර්තු 31 න් අවසන් වසර සඳහා විගණනයේදී හඳුනා ගැනිණි. විගණන නිගමනය අනුව එය රු. 305,000 ක් විය යුතුය. මූල්‍ය අධ්‍යක්ෂවරයා මෙය නිවැරදි කිරීමට එකඟ නොවේ. මෙම ගැටලුව නොවිසඳුණහොත් විගණක වාර්තාවට සිදුවන බලපෑම විස්තර කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක **05**

විගණනයට අදාල පහත නියමයන් කෙටියෙන් විස්තර කරන්න:

i. වෘත්තීය සංසදෘෂ්ටිභාවය (Professional Skepticism)
ii. වෘත්තීය විනිශ්චය (Professional Judgment)
iii. ප්‍රමාණාත්මක බව (Materiality)
iv. මූල්‍ය ප්‍රකාශන සැදැහුම් (Financial Statement Assertions)
v. අඛණ්ඩ පැවැත්ම (Going Concern)

(ලකුණු 05 x 05)

**(මුළු ලකුණු 25)**